



# මැතිවරණ සම්බන්ධයෙන් වන නීති
# (පළාත් සභා ඡන්ද විමසීමට අදාළ නීති හැර)
# සමාලෝචනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහාත්,
# ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් වන
# පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව වෙත පැෆ්රල් සංවිධානය විසින්
# කරනු ලබන යෝජනා

READ NOW

PAFFREL

WWW.PAFFREL.COM

2026-07-15

## 1. ස්වයංක්‍රීයව ඡන්දදායක ලියාපදිංචිය

1.1 ජාතික ඩිජිටල් හැඳුනුම්පත ආශ්‍රිත පද්ධතියට සියලුම පුරවැසියන් සම්බන්ධ කිරීමේ ක්‍රියාවලිය හරහා, ස්වයංක්‍රීයව සියලුම පුරවැසියන් ඡන්ද දායකයින් ලෙස සුදුසුකම් ලබන තත්තවය ඇති කරමින්, වාර්ෂිකව ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඉවත් කිරීමට යෝජනා කෙරේ.

1.2 ඉහත ක්‍රමය එසේ තබා ගනිමින් මහජන විශ්වාසය තහවුරු කිරීම සහ ස්වයංක්‍රීයව ඡන්ද දායකයෙකු බවට පත්වන ක්‍රමවේදයට ප්‍රවේශ වීමට අපහසු ප්‍රජාවට (වැඩිහිටි නිවාස/ ළමා නිවාස) වසර 5 කට හෝ 10කට වරක් ග්‍රාම නිලධාරී ගෙන් ගෙට ගොස් හෝ ඔවුන් පදිංචි ස්ථානයට ගොස් ඡන්ද හිමියන් ලියාපදිංචිය සිදු කළ යුතුය.

1.3 නිශ්චිත වාසස්ථානයක් හෝ ලිපිනයක් නොමැති ප්‍රජාවන් සඳහා (තෙළිඟු සහ යාචක වැනි) එම ප්‍රජාවන් ජීවත්වන ප්‍රදේශ තුළ ඔවුන්ට ආසන්නතම ග්‍රාම නිලධාරී කාර්යාලයේ ලිපිනය, එම පුද්ගලයින්ගේ ලිපිනය ලෙස සළකා ඡන්ද අයිතිය ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

1.4 ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමට අදාළව බලාත්මකව පවතින්නේ 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතයි. ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට අදාළ මූලික සුදුසුකමක් වන්නේ නිවසේ අයිතිය නොව සාමාන්‍ය පදිංචිය යි. ඒ අනුව කුලී නිවැසියන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම "එම කුලී නිවැසියන් ජීවත්වන ප්‍රදේශයේ" අදාළ ග්‍රාම නිළධාරීගේ වගකීමක් සේ සැළකීමට නීතිය බලාත්මක කළ යුතුය.

1.5 ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතුව සිදුවන්නේ දැයි සොයාබැලීමට දේශපාලන පක්ෂවලට සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම නියෝජිතයින් පත් කිරීමේ හැකියාව පවතින නමුත් බොහෝ දේශපාලන පක්ෂ ඒ සඳහා උනන්දුවක් නොමැත. ජාතික ඩිජිටල් හැඳුනුම්පත ආශ්‍රිත පද්ධතියට සියලුම පුරවැසියන් සම්බන්ධ කර ස්වයංක්‍රීයව ඡන්ද හිමියෙකු ලෙස සුදුසුකම් ලබන තත්ත්වය නිර්මාණය වන තෙක් වාර්ෂික ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන බැවින් එකී ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන්නේ දැයි සොයා බැලීම සඳහා දේශපාලන පක්ෂ නියෝජිතයින් නම් කිරීම අනිවාර්යය කිරීමට ක්‍රමවේදයක් සැකසිය යුතුය.

PAFFREL

## 2. විකල්ප ඡන්ද ක්‍රමයක අවශ්‍යතාවය

ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ඡන්ද දායකයන් අතරින් ආසන්න වශයෙන් මිලියන දෙකකට වැඩි ප්‍රමාණයකට ඡන්ද විමසීම් දිනයේදී සිය ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් සිය ඡන්දය භාවිත කිරීමට නොහැකි වේ.

මෙය කොටස් දෙකකට බෙදා වෙන් කල හැකිය.

1. රට තුළ සිටින එහෙත් ඡන්දය දිනයේ දී ප්‍රායෝගික හේතුන් නිසා ඡන්ද පොළට යා නොහැකි පුද්ගලයන්

2. රට තුළ ඡන්ද දායකයන් ලෙස ලියාපදිංචි වී එහෙත් විවිධ හේතුන් මත රටෙන් බැහැරව සිටින පුද්ගලයන්

රට තුළ සිටින එහෙත් ඡන්දය දිනයේ දී ප්‍රායෝගික හේතුන් නිසා ඡන්ද පොළට යා නොහැකි පුද්ගලයන්

2.1 ඡන්දය ලබාදීමට හිමිකම ඇතත් ශාරීරික අශක්නුතාවයක් හෝ වයස්ගත වීම නිසා ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද පොළට පැමිණීමට අපහසුවක් ඇතැයි මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන්නා වූ ඡන්ද හිමියන් සඳහා ජංගම ඡන්ද පොළවල් ස්ථාපිත කිරීම. එමෙන්ම වයස්ගතවීම හේතුවෙන් සංචරණය වීමේ නොහැකියාවක් සහිත ඡන්ද හිමියන් සඳහා ඔවුන්ගේ ලියාපදිංචි ලිපිනයට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසා දීම.

2.2 මැතිවරණ / ඡන්ද විමසීම් දිනයේ රාජකාරීවල නිරතවීම හේතුවෙන් තමාට වෙන්කල ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි ඡන්ද හිමියන්ට විකල්ප ඡන්ද ක්‍රමයක් යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමට ඉඩකඩ ලබාදීම.

රට තුළ සිටින මැතිවරණ / ඡන්ද විමසීම් දිනයේ සිය ඡන්දපොළට ගොස් ඡන්දය භාවිත කළ නොහැකි ඡන්ද දායකයන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් පහත විකල්ප ක්‍රම වලින් එකක් හෝ කිහිපයක් භාවිත කළ හැක.

- තැපැල් ඡන්ද ක්‍රම
- ජංගම ඡන්ද ක්‍රම
- ඔන්ලයින් ඡන්ද ක්‍රම ( E Voting)
- ප්‍රතියුක්තිකයෙකු හරහා ඡන්දය භාවිත කිරීම. (Proxy)
- සේවා ස්ථාන ආසන්නයේ ඡන්ද මධ්‍යස්ථාන පිහිටු වීම.

ඡන්ද දායකයින් ලෙස ලියාපදිංචි වී එහෙත් මැතිවරණ / ඡන්ද විමසීම් දින රටෙන් බැහැරව සිටින ඡන්දය භාවිත කිරීමට නොහැකි ඡන්ද දායකයින් සඳහා

2.3.1 ආරම්භයක් ලෙස විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියේදී මැතිවරණ ක්‍රමයේ පවතින නිදහස් හා සාධාරණ බව ආරක්ෂා වන අයුරින් හා ජනතාවගේ විශ්වසනීයත්වය තහවුරු කිරීමට සුදුසු පරිසරයක් විදේශ

PAFFREL

දූත මණ්ඩල කාර්යාලවල ඇතිකොට ඒවා ඡන්දපොළ ලෙස භාවිත කරමින් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම සුදුසු බවට යෝජනා කරමි. විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් හට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන ආකාරයෙන් ප්‍රතිපාදන සැලසීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පත් කරනු ලැබූ කමිටු වාර්තාවට අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් පන්දහසකට වඩා සිටින රටවල් 17 ක තානාපති කාර්යාල තුළ මෙම ක්‍රියාවලිය ආරම්භ කළ හැකිය.

2.3.2 දෙවන අදියර වශයෙන් ඉදිරියේදී අවශ්‍යතාවය මත,

●තැපෑලෙන් ඡන්දය දීම.

●මාර්ගගත ක්‍රමයක් යොදාගැනීම.

● ඔන්ලයින් ඡන්ද ක්‍රම ( E Voting)

● ප්‍රතියුක්තකයෙකු යොදා ගැනීම (Proxy Voting)  වැනි ක්‍රම සඳහා ද ඉඩකඩ ඇත.

## 4. මැතිවරණ වියදම් සීමාකිරීම

4.1 දැනට ක්‍රියාත්මකවන 2023 අංක 03 දරණ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ ඇති අඩුපාඩු හඳුනාගෙන එම පනත යාවත්කාලීන කිරීමට අදාළ නෛතික ප්‍රතිපාදන සකස් කිරීම.

4.2 ආදායම් සහ වියදම් වාර්තා නිශ්චිත දිනයට ලබානොදෙන අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂ නඩු විභාගයකින් තොරවම වරදකරුවන් බවට පත්කර මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ සඳහන් ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරීම.

4.3 යම් අපේක්ෂකයෙකුට නියමිත දිනයට ආදායම් වියදම් වාර්තා ලබානොදීමට පිළිගත හැකි ප්‍රායෝගික බාධාවක් තිබුණේ නම් එවැනි අය සඳහා අධිකරණය ඉදිරියේ කරුණු දැක්වීමට අවස්ථාවක් සැලසීම.

4.4 මැතිවරණය සඳහා තරගවැදීමට අපේක්ෂා කරන දේශපාලන පක්ෂ / ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයින් වේ නම් නාමයෝජනා ලබාදීමට පෙරාතුව මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා වෙනමම ගිණුමක් පවත්වාගෙන යාම සහ මැතිවරණයට අදාළ සියලු ආදායම් වියදම් එකී ගිණුම හරහා සිදුකළ යුතු බවට නීතිය සංශෝධනය කිරීම.

4.5 අපේක්ෂකයෙකුට හෝ දේශපාලන පක්ෂයකට, තනි පුද්ගලයෙකුගෙන් හෝ ආයතනයකින් ලබාගත හැකි මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාර ප්‍රමාණය අපේක්ෂකයාගේ හෝ පක්ෂයේ මැතිවරණ වියදමින් සියයට 5 කට වඩා වැඩි නොවන පරිදි නීති සම්පාදනය කළ යුතුය.

PAFFREL

4.6 බොහෝ අපේක්ෂකයින් හා දේශපාලන පක්ෂ මැතිවරණයට පෙර සිටම තම ප්‍රචාරක කටයුතු සිදුකරන බැවින් මැතිවරණ කාලසීමාව පිළිබඳව නිශ්චිත අර්ථ නිරූපණයක් ලබාදීම.

4.7 මැතිවරණයකදී/ ඡන්ද විමසීමකදී අපේක්ෂකයින්ගේ වියදම් අධීක්ෂණය සහ නිරීක්ෂණය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව යටතේ පූර්ණ බලතල සහිත ඒකකයක් ස්ථාපිත කිරීම.

4.8 අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්ගේ වියදම් සීමාවට අදාළ නීති උල්ලංඝනය කරන අවස්ථාවලදී අධිකරණයට යාමට අවශ්‍ය වේ නම් ඒ සඳහා අවශ්‍ය කරන බලතල මැතිවරණ කොමිෂන් සභාවට ලබාදීම.

4.9 අපේක්ෂකයින්ගේ ආදායම් සහ වියදම් වාර්තා ඒ ඒ මැතිවරණය අවසානයේදී ඉදිරිපත් කිරීම වෙනුවට, දෛනිකව යාවත්කාලීන කිරීම සඳහා ඩිජිටල් ක්‍රමවේදයක් සහ නීතිමය රාමුවක් සකස් කිරීම.

4.10 අවම වශයෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත්වන අපේක්ෂකයින්ගේ ආදායම් සහ වියදම් වාර්තා වරලත් ගණකාධිකාරීවරයෙකුගේ අනුමැතිය සහිතව ඉදිරිපත් කිරීම.

4.11 දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ආදායම් වියදම් වාර්තාවල ගැටලුකාරී තත්ත්වයක් මතු වූ විට නෛතික ක්‍රියාමාර්ග සඳහා යොමු වීමට මැතිවරණ කොමිසමට සහ උනන්දුවක් දක්වන පුරවැසියන්ට ඉඩ ප්‍රස්ථාව ලැබෙන පරිදි ප්‍රතිපාදන පනතට ඇතුළත් කල යුතුය.

4.12 මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් ඇතුළත් අධීක්ෂණ කමිටුවක් පත් කිරීම.

## 5. රාජ්‍ය බලය හා රාජ්‍ය / පොදු දේපළ අවභාවිත වීම වැළැක්වීම

5.1 රාජ්‍ය බලය හා රාජ්‍ය / පොදු දේපළ පිළිබඳව ඇති නිර්වචනය වඩාත් නිශ්චිත විය යුතුය.

5.2 ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, කැබිනට් අමාත්‍යවරු ස්වකීය තනතුරට හිමිවන සම්පත් හා බලය මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතවීම වැළැක්වීමට නීති සම්පාදනය කිරීම (ජනාධිපති කාර්යාලය, දේශපාලන රැස්වීම් සඳහා භාවිත කිරීම, ආරක්ෂක අංශ සතු හෙලිකොප්ටර්, වාහන, නිලධාරීන් - එවැනි දෑ භාවිත කරන්නේ නම් ඒ සඳහා කිසියම් මිලක් නියම කිරීම හා ඒ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව දැනුවත් කර ඊට අදාළ අවසර ලබාගැනීමේ ක්‍රමවේදයක් සහ ඊට අදාළ නීතිමය රාමුවක් සැකසීම)

5.3 මැතිවරණ වලදී අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, රජයේ අයවැය හරහා සිදුකරන සංවර්ධන ව්‍යාපෘති අවභාවිත කිරීම වැළැක්වීම සඳහා, සුදුසු නීති සකස් කිරීම සහ ඒවා බලාත්මක කිරීම.

5.4 මැතිවරණ කාල සීමාව තුළ, දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, රජයට/රාජ්‍යය සංස්ථාවකට/රාජ්‍ය අධිකාරියකට හෝ රජය සතු සමාගමකට අයත් නිශ්චල හෝ චංචල දේපළ භාවිත කිරීම තහනම් කිරීමට කටයුතු කිරීම (අදාළ පනත්වල මෙම ක්‍රියාවන් නිතී විරෝධී ලෙස නම් කිරීම).

5.5 යම් දේශපාලන පක්ෂයක්/ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, රජයේ නිලධාරීන් සතු හැකියාව, දැනුම හා කාලය/රජයේ දේපළ (වාහන/ප්‍රචාරක උපකරණ/ ඡායා පිටපත් යන්ත්‍ර/දුරකතන) අවභාවිත කිරීම තහනම් කිරීමට කටයුතු කිරීම (අදාළ පනත්වල මෙම ක්‍රියාවන් නිතී විරෝධී ලෙස නම් කිරීම).

5.6 රාජ්‍ය ආයතන / සංස්ථා / අධිකාරී / රජය සතු සමාගම්වලට අයත් සම්පත් මැතිවරණ / ඡන්ද ව්‍යාපාරයට ලබාදීමේදී යම් කණ්ඩායමකට විශේෂ වාසියක් හෝ අගතියක් නොවන පරිදි සාධාරණ පදනමින් ලබාදිය යුතුය.

## 6. ප්‍රතිපත්ති ප්‍රකාශන

6.1 මැතිවරණයට පෙර අපේක්ෂකයෙක් හෝ දේශපාලන පක්ෂයක් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශන, අදාළ ධූර කාලය/නිල කාලය තුළදී ක්‍රියාත්මක කළ හැකි ලෙස ප්‍රායෝගික හා නිශ්චිත කාල රාමු සහිතව ඉදිරිපත් කිරීම සඳහා දිරි ගැන්වීම සහ එය පූර්ව කොන්දේසියක් ලෙස සළකා රෙගුලාසි යෙදීම.

6.2 නාමයෝජනා බාරදෙන අවස්ථාවේදීම, මැතිවරණ කොමිෂන් සභාව වෙත ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත්කොට ප්‍රසිද්ධ කිරීම සහ එය පක්ෂයේ ලේකම්වරයා හා අපේක්ෂකයා විසින් අත්සන් කළ ලේඛනයක් ලෙස නෛතික පදනමකට යටත් කිරීම.

6.3 ජනාධිපති ධූරය ආරම්භ වී වසර දෙකක් ඉක්මයාමෙන් අනතුරුව එම ප්‍රතිපත්ති ප්‍රකාශනවලට හෝ ලබාදුන් පොරොන්දු වලට අනුකූලව කටයුතු කර නොමැති බව තහවුරු වන්නේ නම් ඔවුනට එරෙහිව විශ්වාසය කඩ කිරීම, ගිවිසුම් කඩකිරීම යටතේ අධිකරණයට යාමට පුරවැසියාට බලය හිමි කිරීම හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවාගැනීමට අධිකරණ නියෝගයක් ගැනීමට හැකි නෛතික බලය සහිත ලියවිල්ලක් බවට පත් කිරීම.

6.4 අපේක්ෂකයින් සහ දේශපාලන පක්ෂ ලබාදෙන ප්‍රතිපත්ති ප්‍රකාශන නීතිමය පදනමක් ඇති කිරීම සහ ඔවුන් නීතිමය වගවීමකට ලක් කළ යුතුය.

6.5 ප්‍රතිපත්ති ප්‍රකාශන මැතිවරණ කොමිෂන් සභාව විසින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සැකසීම කළ යුතුය.

6.6 මැතිවරණය ජයග්‍රහණය කරන අපේක්ෂකයාගේ/දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය, ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස පිළිගැනීම සහ එය නිශ්චිත කාල රාමු සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ හැකි ලෙස ඉදිරිපත් කිරීම.

## 7. නාමයෝජනා ප්‍රතික්ෂේප වීම

7.1 දැනට ඇති නීතිමය ප්‍රතිපාදන අනුව, මැතිවරණ කොමිෂන් සභාව නාමයෝජනා ප්‍රතික්ෂේප කරනු ලබන්නේ (අදාළ මැතිවරණ පනත් වල ප්‍රතිපාදනවලට අනුව) ඉතාම තාක්ෂණික කාරණා කිහිපයක් පමණක් සැලකිල්ලට ගනිමිනි. එසේ වුවත්, කිසියම් නීතියක, අපේක්ෂකයෙකු වීමට අදාළව සඳහන්ව ඇති නුසුදුසුකම් පරීක්ෂා කිරීමේ නීතිමය ප්‍රතිපාදන සැකසිය යුතුය.

උදාහරණ -

- ද්විත්ව පුරවැසිභාවය පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් සැකසීම (සෑම අපේක්ෂකයෙක්ම තම නාමයෝජනා පත්‍රය සමග තමා මැතිවරණයට තරග කිරීමට නුසුදුස්සෙක් නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් ලබාදිය යුතුය)

7.2. 2025 පළාත් පාලන ඡන්ද විමසීමේදී, පළාත් පාලන ආයතනවලින් 2/3 කම අවම වශයෙන් එක් නාමයෝජනා පත්‍රයක් හෝ ප්‍රතික්ෂේපවීම නිරීක්ෂණයට ලක් විය. මෙනිසා, නාමයෝජනා ප්‍රතික්ෂේප වීමට අදාළ කරුණු නැවත සළකා බලා, නාමයෝජනා ප්‍රතික්ෂේපවීම අවම කරගැනීම සඳහා අවශ්‍ය සංශෝධන සිදුකිරීම හා ක්‍රියාපටිපාටිය නිශ්චිත කිරීමට පියවර ගත යුතුය.

7.3 නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වූ විට ඒවා නැවත සකස්කොට, ඉදිරිපත් සඳහා පැය 24 ක අමතර කාල සීමාවක් ලැබෙන පරිදි නීති බලාත්මක කළ යුතුය.

## 8. මැතිවරණ කොමිෂන් සභාවේ බලතල පුළුල් කිරීම

8.1 මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන්ගේ ස්වාධීනභාවය හා අපක්ෂපාතීත්වය, වෘත්තීය සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම සඳහා එය වෙනමම සේවාවක් ලෙස ස්ථාපිත කිරීම.

8.2 මැතිවරණ කොමිෂන් සභාවට පත්කරනු ලබන සාමාජිකයින් ද්විත්ව පුරවැසියන් නොවන, ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු බවට නීති සැකසීම.

8.3 මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සහ ක්‍රියාකාරීත්වය කාර්යක්ෂම කිරීමට අවශ්‍ය අඩුපාඩු හඳුනාගැනීම හා ඒවාට අදාළ නීති සකස් කිරීම.

8.4 බලයේ සිටින ආණ්ඩුවේ බලපෑම්වලින් තොරව, මැතිවරණ දිනය තීන්දු කිරීම සහ මැතිවරණ පැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක්වන මූල්‍ය ස්වාධීනතාවය ලබාදීම. ඒ සඳහා සෑම වර්ෂයකම මැතිවරණයකට අවශ්‍ය තරම් මුදල් මැතිවරණ කොමිෂන් සභාවේ ගිණුම වෙත වාර්ෂිකව මුදාහැරෙන ක්‍රමවේදයක් ඇතිකිරීමට නීතිමය යාන්ත්‍රණයක් සකස් කිරීම.

8.5 මැතිවරණ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පැමිණිලි විමර්ශනයෙන් පසුව නඩු පැවරීමේ බලය මැතිවරණ කොමිසමට පැවරෙන සේ නීති සකස් කිරීම හා එසේ නඩු නොපවරන අවස්ථාවන්හීදී ඊට අදාළ හේතු ඇතුළත් කරමින් වාර්තාවක් ප්‍රකාශයට පත්කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරීම.

8.6 පළාත් පාලන ඡන්ද විමසීමෙන් අනතුරුව පිහිටුවනු ලබන පළාත් පාලන ආයතනවල අඛණ්ඩ හා සක්‍රීය ක්‍රියාකාරිත්වය සඳහා දේශපාලන පක්ෂවලින් නම් කළ යුතු සභිකයින් නියමිත කාලසීමාවක් තුළ නම් කළ යුතුය. යම් හෙයකින් අදාළ කාල සීමාව තුළ තම සභිකයින් නම් කිරීමට අපොහොසත් වන දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් වේ නම් සුදුස්සන් පත්කිරීම සඳහා මැතිවරණ කොමිසමට බලය පැවරෙන නීති සම්පාදනය කිරීම.

8.7 පළාත් පාලන ආයතනවල සභාපතිවරයා හෝ නගරාධිපතිවරයා තෝරාගැනීමට මාස 3 ක් ඇතුළතදී අපොහොසත්වන අවස්ථාවන්වලදී, එම සභා විසුරුවා හැර ඡන්ද විමසීමක් පැවැත්වීමට මැතිවරණ කොමිසමට බලය පැවරෙන නීති සම්පාදනය කිරීම.

8.8 මැතිවරණ කැලැන්ඩරය ක්‍රියාත්මක නොවන අවස්ථාකදී, මැතිවරණයක් පැවැත්විය යුතු බවට අදාළ ගැසට් නිවේදනය නිකුත් කළ පසු, මැතිවරණ කොමිෂන් සභාව එකී ක්‍රියාවලිය සිදු කරගෙන යාමේදී, ඊට දින වකවානු තීන්දු කිරීමේදී සතියක පමණ කාලයක් (දින 7) දීර්ඝ කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට ලබාදිය යුතුය. (නාමයෝජනා කැඳවීම, මැතිවරණ දින) විශේෂයෙන් කාල පරාසයන් පිළිබඳ වඩාත් සැළකිලිමත් විය යුතුය.

## 9. මැතිවරණ කැලැන්ඩරය

9.1 සෑම මැතිවරණයක්ම පැවැත්වීමේ කාලරාමුව නීතියෙන් නියම කළ යුතු අතර මැතිවරණ හෝ ඡන්ද විමසීම දිනය තීන්දු කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරෙන පරිදි නීති සම්පාදනය කිරීම.

9.2 ව්‍යවස්ථාපිත නීතියේ පැහැදිලිව සඳහන් ව්‍යතිරේඛී හේතුවක් මත මිස, කිසිදු මහජන නියෝජිත ආයතනයක් නිසි කාලය සම්පූර්ණවීමට පෙර විසුරුවා හරිනු ලැබීමට ඇති අවස්ථාව අහෝසි කිරීම.

9.3 පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා පවත්වන ඡන්ද විමසීම, සුවිශේෂී අවස්ථාවකදී හැර, එකවර සමස්ත රට සඳහාම පැවැත්විය යුතු බවට නීති සැකසීම.

## 10. දේශපාලන පක්ෂ ලියාපදිංචිය

10.1 දේශපාලන පක්ෂයක් ලියාපදිංචි කිරීමේ දී අවම වශයෙන් මැතිවරණ දිස්ත්‍රික්ක තුනක් තුළවත්, එහි සංවිධාන ව්‍යුහය තිබිය යුතු බවට, හා අවම වශයෙන් දහසක හෝ සාමාජික පිරිසක් සිටින බවට තහවුරු කරගත යුතු බවට නීති සැකසීම (ඒ සඳහා දේශපාලන පක්ෂ සාමාජිකයන්ගේ අත්සන් ලේඛනයක් භාවිත කළ හැක).

10.2 දේශපාලන පක්ෂ ලියාපදිංචිය අදියර කිහිපයක් යටතේ සිදුකිරීම.

- ප්‍රාදේශීය දේශපාලන පක්ෂ (ප්‍රාදේශීය අනන්‍යතාවයන් නියෝජනය කිරීම සඳහා)

- පළාත් මට්ටමින් ක්‍රියාත්මක දේශපාලන පක්ෂ
- ජාතික දේශපාලන පක්ෂ

10.3 දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ නීතියට, ලියාපදිංචියෙන් පසු එම දේශපාලන පක්ෂ විධිමත් ලෙස අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාවලියක් හඳුන්වා දීම. පක්ෂ ලියාපදිංචි නීතියට ලියාපදිංචියෙන් පසු විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් එකතු කිරීමට මැතිවරණ කොමිසමට බලය පැවරීම.

10.5 පිළිගත් දේශපාලන පක්ෂවල වාර්ෂික ගිණුම් වාර්තා, ප්‍රධාන නිලධාරීන්ගේ නාමලේඛන, එකී නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ, හා පක්ෂ ව්‍යවස්ථා, මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පල කිරීම අනිවාර්යය කරන නීතියක් සම්පාදනය කිරීම.

10.6 වාර්ෂිකව විගණනය කරන ලද ගිණුම් වාර්තා ලබානොදෙන දේශපාලන පක්ෂ පිළිගැනීම අවලංගු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරීම.

10.7 අඛණ්ඩව මැතිවරණ තුනකට ඉදිරිපත් නොවන්නේ නම්, එම දේශපාලන පක්ෂවල පිළිගැනීම අවලංගු කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

10.8 වාර්ෂික සම්මේලන නොපවත්වන දේශපාලන පක්ෂ ලියාපදිංචියෙන් ඉවත් කිරීමට අදාළ නීති සැකසීම.

10.9 දේශපාලන පක්ෂ විධායක මණ්ඩලවල අවම වශයෙන් 30% ක කාන්තා හා තරුණ නියෝජනයක් නොමැති නම් එම පක්ෂ ලියාපදිංචියෙන් ඉවත්කිරීමට අදාළ නීති සැකසීම.

10.10 කිසියම් දේශපාලන මතවාදයක් සහිත කණ්ඩායමකට එකී මතය නියෝජනය කිරීම සඳහා දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමට ඉඩකඩ තිබිය යුතු වුවද, පුද්ගලික අභිමතාර්ථ මුදුන්පත් කරගැනීම අරහයා සිදුකරන එවැනි ක්‍රියාවන්ට ඇති ඉඩකඩ ඇහිරීමට අදාළ නීති සැකසීම.

## 11. ජාතික ලැයිස්තුව මගින් අපේක්ෂකයන් තෝරා ගැනීම

මෙම යෝජනාව අදාල වන්නේ පවතින මැතිවරණ ක්‍රමය වෙනස් නොකරන තත්ත්වයක් තුළ පමණි.

11.1 ජාතික ලැයිස්තුව මගින් තේරී පත්වන මන්ත්‍රීවරු සංඛ්‍යාව 29 කට සීමා විය යුතු ලෙස නීතියක් ගෙන ඒම.

11.2 ජාතික ලැයිස්තුව සඳහා නම් කළ හැක්කේ සුදුසුකම් සහිත විවිධ ක්ෂේත්‍රවල උගත් බුද්ධිමත් හා විශේෂඥභාවය ඇති පුද්ගලයන්, නියෝජනයක් නොලබන හෝ ප්‍රමාණවත් නියෝජනයක් නොලබන වාර්ගික හා ආගමික කණ්ඩායම් හා වෙනත් කණ්ඩායම්වල නියෝජිතයින් විය යුතු ලෙස නීතියක් ගෙන ඒම.

11.3 ඒ ඒ පක්ෂ විසින් ජාතික ලැයිස්තුව සඳහා නම් කළ පුද්ගලයන් ගේ අධ්‍යාපන මට්ටම සහ ඔහු හෝ ඇය  දැනුම සහ පළපුරුද්ද ඇති ක්ෂේත්‍රය හෝ නියෝජනයක් නොලබන ලද හෝ ප්‍රමාණවත් නියෝජනයක් නොලද කණ්ඩායම කුමක්ද යන්න දැක්විය යුතුය. ඒ සඳහා විධිමත් පෝරමයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කිරීම.

11.4 විශේෂඥභාවය සහ නියෝජනය කරන ඉහත කී කණ්ඩායම සහිතව නම් ලැයිස්තුව නාම යෝජනා බාරදෙන අවස්ථාවේදීම ප්‍රසිද්ධ කිරීම. ඉහත සුදුසුකම් සපුරාලමින් ජාතික ලැයිස්තුව නියෝජනය කරන පුද්ගලයින්ගේ එම අපේක්ෂකයා නියෝජනය කරනු ලබන්නේ කුමන විශේෂඥභාවය ද යන්න සහ යම් ජන ප්‍රජාවක් නියෝජනය කරනු ලබන්නේ නම් ඒ කුමන ජන ප්ර්ජාවක්ද යන්න නාම යෝජනා ලැයිස්තු භාරදෙන අවස්ථාවේදීම ප්ර්සිද්ධ කළ යුතුය.

11.5 ලැයිස්තුවේ දක්වා ඇති පුද්ගලයන්ගෙන් පමණක් ජාතික ලැයිස්තුව සමන්විත විය යුතු අතර, කිසිදු හේතුවක් මත පරාජිත අපේක්ෂකයන් හෝ වෙනත් තැනැත්තන් ජාතික ලැයිස්තුවෙන් පත් කරනු නොලැබිය යුතුය. මින් පරිබාහිරව යම් පත්කිරීමක් ජාතික ලැයිස්තුවට සිදුකරන්නේ නම් එය තරඟ කරන එක් පක්ෂයකට/සන්ධානයකට හෝ ස්වාධීන කණ්ඩායමකට උපරිමය තිදෙනෙක් හෝ සියයට 30 ක් ලෙස සීමා කළ යුතුය.

11.6 ජාතික ලැයිස්තුවේ මන්ත්‍රී ධූර තුනකට වඩා හිමිවන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් ලැයිස්තුවේ හතර වන තැනැත්තා කාන්තාවක් වන බවට වග බලා ගත යුතුය. ඒ අනුව 4, 8, 12,.... ආදී ලෙස කාන්තාවන් පත්විය යුතුය.

## 12. අපේක්ෂකයන්ගේ ජීවදත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

12.1 මැතිවරණයකදී නාමයෝජනා ලබාදෙන අපේක්ෂකයන් මැතිවරණ කොමිෂන් සභාව මගින් ලබාදෙන ආකෘතියකට අනුව ජීවදත්ත පත්රිකාවක් නාමයෝජනා ලබාදෙන විටම තේරීම්භාර නිලධාරියාට ලබාදීම අනිවාර්යය කිරීම.

12.2 එසේ ලබාදෙන තොරතුරු නාමයෝජනා බාරගෙන ඡන්ද විමසීමට සති දෙකකට පෙරාතුව ජනතාවට දැනගැනීමට හැකිවන පරිදි ප්‍රසිද්ධියට පත්කිරීම.

12.3 අධිකරණ විනිසුරුවරුන්, මාණ්ඩලික නිලධාරීන්, හමුදාවේ ඉහළ නිලධාරීන්, පොලිස් සේවයේ ඉහළ නිලධාරීන් හා සංස්ථාපිත මණ්ඩලවල ඉහළ නිලධාරීන්, කොමිෂන් සභා සාමාජිකයින්, ග්‍රාම නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළු රාජ්‍ය බලය, ධනය හා සුබසාධන ක්‍රියාවලින් හැසිරවූ නිළධාරීන් විශ්‍රාම යාමෙන් හෝ එම තනතුරෙන් ඉවත්වීමෙන් වසර 3 ක් ඉක්ම යනතෙක් කිසිදු මැතිවරණයකට තරඟ කිරීමට නොහැකි වන සේ නීති සම්පාදනය කල යුතුය.

PAFFREL

## 13. පක්ෂ මාරුකිරීම

13.1 ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ක්‍රමයට අනුව ඡන්දදායකයා ඡන්දය ලබාදෙන්නේ පක්ෂයට වන බැවින් යම් අපේක්ෂකයෙකුට සිය ප්‍රතිපත්තියට අනුව තවදුරටත් තමා නියෝජනය කරන පක්ෂයේ කටයුතු කළ නොහැකි නම්, ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කිරීම හැර  පක්ෂ මාරු කිරීමක් සිදුකළ නොහැකි වන ආකාරයට නීති සම්පාදනය විය යුතුය.

13.2 ආණ්ඩු පක්ෂයේ සිට විපක්ෂයට මාරුවීම හේතුකොට ගෙන, ඔහුගේ හෝ ඇයගේ මන්ත්‍රී ධුරය අහිමි නොවිය යුත්තේ ය. ඔහුගේ හෝ ඇයගේ කණ්ඩායම මාරුවීම නිසා ආණ්ඩු බලය මාරු වේ නම් ඔහුගේ හෝ ඇයගේ මන්ත්‍රී ධුරය අහිමි කළ යුතුය.

14. ආබාධ සහිත ඡන්දදායකයින්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම

14.1 ස්ථිර ආබාධ සහිත පුරවැසියන්ට ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමේදී ඔවුන් ඉල්ලුම් කරන්නේ නම් ඔවුන්ගේ ආබාධය හඳුනාගත හැකි ආකාරයේ සංකේත ඇතුළත් කරමින් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම.

14.2 දෘශ්‍යාබාධිත පුද්ගලයින්ට ඡන්දපොළ තුළදී බාධාවකින් තොරව, විශ්වසනීයව සිය ඡන්දය භාවිත කිරීම සඳහා බ්‍රේල් ක්‍රමවේදය හෝ වෙනත් තාක්ෂණික ක්‍රමවේදයක් සැකසීම.

14.3 මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන නිල නිවේදන සහ අපේක්ෂකයන්/දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශන ත්‍රෛභාෂාවන්ගෙන් ,සංඥා, බ්‍රේල්, සහ හඬ මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කිරීම.

14.4 ආබාධ සහිත ප්‍රජාවට සිය ඡන්දය ප්‍රකාශ කිරීමේදී ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම සහ සහායකයෙකු කැටුව යාම සඳහා ඔවුන් අධෛර්යයමත් කරන දැනට ඇති සංකීර්ණ ක්‍රියාවලිය වෙනුවට වඩා පහසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට නීති සම්පාදනය කිරීම.

14.5 ආබාධිත ප්‍රජාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ඡන්ද මධ්‍යස්ථාන (Accessible Polling Stations) සකස් කිරීමට කටයුතු කිරීම, භෞතික පහසුකම් ශක්තිමත් කිරීම, සියලුම ඡන්ද මධ්‍යස්ථානවල රෝද පුටු භාවිත කරන්නන් සඳහා බෑවුම් මාර්ග (Ramps) සකස් කිරීම.

14.6 දෘශ්‍යාබාධිත පුරවැසියන්ට වෙනත් අයෙකුගේ උදව් රහිතව තමන්ට අවශ්‍ය අපේක්ෂකයාට තනිවම ඡන්දය සලකුණු කළ හැකි පරිදි බ්‍රේල් ක්‍රමයට සකස් කළ ඡන්ද පත්‍රිකා හෝ ස්පර්ශක ආකෘති ( Tractile Ballot Templates) හඳුන්වා දීම මගින් රහස්‍යභාවය සහ ස්වාධීනත්වය සුරැකීම (Secrecy & Independence).

14.7 රෝද පුටු භාවිත කරන්නන්ට සහ මිහිමිත් පුද්ගලයන්ට පහසුවෙන් ඡන්දය සළකුණු කළ හැකි පරිදි ඡන්ද පෙට්ටි ස්ථාපිත කිරීම.

14.8 සංඥා භාෂා පරිවර්තනය (Sign Language)

(මැතිවරණ කාල සීමාව තුළ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නිල නිවේදන අපේක්ෂකයින්ගේ රූපවාහිනී ප්‍රචාරණ කටයුතු සහ මැතිවරණ විවාදයන්හිදී සංඥා භාෂා පරිවර්තනය අනිවාර්යය කිරීම.)

14.9 පහසුවෙන් කියවිය හැකි ලේඛන

ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් මැතිවරණ නීති සහ ඡන්දය ප්‍රකාශ කරන ආකාරය සරල රූප සටහන් සහ පහසු භාෂාවෙන් (Easy-to-read formats) ප්‍රකාශයට පත් කිරීම.

14.10. මැතිවරණ දිනයේදී අපේක්ෂකයන්/දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ආබාධ සහිත පුද්ගලයින් ප්‍රවාහනය කිරීම, ඔවුන්ට බලපෑම් කිරීම, අනුග්‍රහය දැක්වීම වැනි මැතිවරණ නීති උල්ලංඝනය කරනු ලැබිය හැකි හැකි ඉඩ ප්‍රස්ථා අවම කිරීම.

14.11 කථන සහ ශ්‍රවණ ආබාධ සහිත පුද්ගලයන් සමග සන්නිවේදනය කිරීමට ඡන්ද කුටිය තුළ සරල සංකේත සහ පින්තූර සහිත සන්නිවේදන කාඩ්පත්, (Communication Boards) තැබීම.

14.12 පහසුවෙන් අල්ලාගත හැකි පෑනක් ( Easy-Grip Pens) දෑත්වල වෙව්ලීමක් හෝ ඇඟිලි ක්‍රියාකාරිත්වයේ දුර්වලතා ඇති (උදා: ආඝාතය හෝ ස්නායු ආබාධ සහිත ) පුරවැසියන්ට ,**X**, ලකුණ පහසුවෙන් තැබිය හැකි පරිදි ඝනකම වැඩි රබර් ග්‍රිප් සහිත පෑනක් ඡන්ද කුටි තුළ තැබීම.

14.13 ආබාධ සහිත ප්‍රජාවගේ දේශපාලන අයිතිය තහවුරු කිරීම

නාම යෝජනා ලැයිස්තු

දේශපාලන පක්ෂවල ජාතික ලැයිස්තු (National Lists) හෝ ප්‍රාදේශීය නාම යෝජනා ලැයිස්තුවල ආබාධ සහිත පුද්ගලයින් සඳහා නිශ්චිත නියෝජනයක් වෙන් කිරීම (Quota system).

## 15. ප්‍රමාණවත් කාන්තා හා තරුණ නියෝජනය තහවුරු කිරීම.

15.1 පළාත් පාලන, පළාත් සභා සහ පාර්ලිමේන්තු ආයතන තුන සඳහාම කාන්තා සහ තරුණ නියෝජනය සඳහා අවම වශයෙන් සියයට 25 ක කෝටාවක් තහවුරු කිරීමට නීති සම්පාදනය කිරීම.

15.2 දේශපාලන පක්ෂ ලියාපදිංචියේදී ඒවායේ විධායක මණ්ඩලවලට අවම වශයෙන් කාන්තාවන් හා තරුණයින් සියයට 30 ක නියෝජනයක් අනිවාර්යය වන ආකාරයට නීති සම්පාදනය කිරීම.

15.3 කාන්තා නියෝජනය 30% ක වඩා ලබාදෙන පක්ෂ දිරිමත් කිරීම සඳහා විශේෂ පහසුකම් - වරප්‍රසාද ලබාදීමට හැකිවන සේ මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරීම. (එම පහසුකම් හෝ වරප්‍රසාද නිශ්චිත ලෙස සඳහන් විය යුතු අතර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසිය යුතුය.

## 16. ප්‍රචාරණය සම්බන්ධ නීති (විද්‍යුත් /මුද්‍රිත)

16.1 මැතිවරණයකදී මාධ්‍ය ආයතන සිය මාධ්‍ය භාවිතාව හරහා ඡන්දදායකයින්ගේ මතයට සැලකිය යුතු බලපෑමක් එල්ලකරන බැවින්, මාධ්‍ය ආයතන සමබරව පවත්වා ගැනීමට මැතිවරණ කොමිසමට බලය පැවරෙන නීති සැකසිය යුතුය.

16.2 මැතිවරණ කාලසීමාව තුළ විද්‍යුත්, මුද්‍රිත සමාජ මාධ්‍ය නියාමනය සඳහා මැතිවරණ කොමිෂන් සභාව යටතේ ස්වාධීන හා පූර්ණ බල සහිත ව්‍යුහයක් ස්ථාපිත කල යුතුය. (මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන බලාත්මක කල යුතුය. එමෙන්ම, එවැනි උපමාන නොසලකා හරින මාධ්‍ය ආයතන වලට මැතිවරණ ප්‍රතිඵල නිකුත් නොකිරීම, නිල තොරතුරු ලබාදීමෙන් වැළකිම වැනි ක්‍රමවේද සැකසිය යුතුය.

16.4 මැතිවරණ සහ ඡන්ද විමසීම් වලට අදාළව (ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන) ප්‍රචාරණ සහ මැතිවරණ ප්‍රචාරණ සමය පිළිබඳ නීතිමය ප්‍රතිපාදනවල ඒකමිතියක් තිබිය යුතුය.

16.5 මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාම යෝජනා කරන දිනය සහ ඡන්ද විමසීම සිදු කරනු ලබන දිනය පිළිබඳව දැන්වීම ප්‍රකාශයට පත් කිරීමේදී අදාළ මැතිවරණයට අදාළ කාලය නිශ්චිතව දැක්විය යුතු බවට පනත සංශෝධනය විය යුතුය.

## 17.මැතිවරණ කාල සීමාව තුළ සමාජ මාධ්‍ය භාවිතය

17.1 මැතිවරණ කාල සීමාව තුළ සමාජ මාධ්‍යය හරහා දූස් තොරතුරු/වෛරී ප්‍රකාශ සහ තොරතුරු වැරදි ආකාරයට අර්ථකතනය කිරීම් සහ පවතින මැතිවරණ නීති උල්ලංඝනය කරමින් සිදුකරන ප්‍රචාරණයන් වැළැක්වීම සඳහා මැතිවරණ කොමිසමට බලය පැවරිය යුතුය.

17.2 මැතිවරණ ප්‍රචාරණ නීතිය තුළට, ජංගම හා ස්ථාවර දුරකථන මගින් සිදුකරනු ලබන සංවිධානාත්මක මැතිවරණ ප්‍රචාරණ සිදු නොකිරීමේ වගකීම දුරකතන සමාගම් වලට පැවරෙන ආකාරයේ නීති සම්පාදනය කල යුතුය. එය නියාමනය හා නඩු පැවරීම මැතිවරණ කොමිෂන් සභාව මගින් සිදුකල යුතුය.

- කෘතිම බුද්ධිය සහ මැතිවරණ

17.3 ඉදිරි මැතිවරණවලදි කෘතිම බුද්ධිය භාවිත කරමින් අපේක්ෂකයන් සහ දේශපාලන පක්ෂ අගතියට පත් කිරීම වෙනුවෙන් වන වෛරී ප්‍රකාශ/ වැරදි සහගත තොරතුරු ආදිය සමාජගත කිරීමේ සම්භාවිතාවක් පවතින හෙයින් මැතිවරණයක/ ඡන්ද විමසීමක සුජාත භාවය ආරක්ෂා කිරීම සඳහා එවැනි තත්ත්වයන් වළක්වාලීම වෙනුවෙන් නව නීති සම්පාදනය කළ යුතුය.

## 18. මැතිවරණ / ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම් සඳහා පූර්ණ බලැති අධිකරණයක්

18.1 මැතිවරණ / ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම සහ මැතිවරණයේ වලංගු භාවය පිළිබඳ ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සියල්ල විමර්ෂණය කර තීන්දුවක්

ලබාදීම සඳහා අභියාචනාධිකරණ විනිසුරුවරුන් හෝ ඊට ඉහළ විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත පූර්ණ බලැති අධිකරණයක් ස්ථාපිත කිරීම.

18.2 මැතිවරණයට අදාළ නඩු විභාග කිරීමේදී අවම වශයෙන් වසරක් ඇතුළත තීන්දු ලබා ගැනීමට හැකිවන පරිදි නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම.

## 19. ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත්වන අපේක්ෂකයින් සීමාකිරීම

19.1 හුදු ජනප්‍රිත්වය හෝ පුද්ගලික ප්‍රතිලාභ අරභයා ජනාධිපතිවරණයට ඉදිරිපත්වීම දක්නට ලැබෙන බැවින් සහ එවැනි අපේක්ෂකයින් හේතුකොටගෙන මහජන දේපළ විශාල නාස්තියකට ලක්වන බැවින්ද ජනමතය විකෘතිභාවයට ලක්වීමට එම තත්ත්වය හේතුවන බැවින්ද එවැනි අපේක්ෂකයින් මැතිවරණය සඳහා ඉදිරිපත්වීම වැළැක්වීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. (දඩ මුදල් වැඩි කිරීම වැනි) මෙහිදී කිසියම් මතවාදයක් ජනගත කිරීම වෙනුවෙන් තරඟවදින අපේක්ෂකයින් අධෛර්යමත් නොවන ආකාරයේ ක්‍රමවේදයක් සැකසිය යුතුය.

## 20. පළාත් පාලන පනත යටතේ වරදකරුවකු වී නඩු තීන්දුවක් මගින් සභික ධූරය අහෝසි වූ අවස්ථාවකදී

පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥා පනතෙහි 262 අධිකාරයේ 82 අ /ආ වගන්ති අධිකාරය) වගන්ති යටතේ, තමාවෙත එවන ලද මැතිවරණ විනිශ්චයකාරවරයාගේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව ලැබුණු විට ජනාධිපතිවරයා විසින් වාර්තාවේ පිටපතක් ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිශ්චිත කාලයක් නියම කිරීම කළ යුතුය

## 21. මහජන නියෝජිතයින් නැවත කැඳවීම

මැතිවරණ/ඡන්ද විමසීම්වලදී ජනතාවට ලබාදුන් පෙරොන්දු ඉටු කිරීමට අපොහොසත් වූ හෝ ඒ සඳහා ප්‍රමාණවත් උනන්දුවක් නොදක්වන මහජන නියෝජිතයින් සිය ධූර කාලය අවසන් වීමට පෙර නැවත කැඳවීම සඳහා වන නීති සම්පාදනය විය යුතුය. ධූරය ආරම්භ වී වසර දෙකක් ඉක්මයාමෙන් අනතුරුව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හෝ ලබාදුන් පොරොන්දුවලට අනුකූලව කටයුතු කර නොමැති බවට තහවුරු වන්නේ නම් නිශ්චිත අත්සන් ප්‍රමාණයක් සහිතව ඉදිරිපත් කරන යෝජනාවක් හෝ ඡන්ද පෙත්සමක් මගින් ඉවත් කිරීමට අදාළ පියවර ගත යුතුය.

**ඉන්දියාවේ පළාත් පාලන ආකෘතිය - The Indian Local Level Model** ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශ්, බිහාර් වැනි ප්‍රාන්තවල ක්‍රියාත්මක කරනු ලබන ඉන්දියාවේ පළාත් පාලන ආකෘතිය ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල සභිකයන් නැවත කැඳවීම සඳහා **(Recalling System)** ආරම්භයක් ලෙස අත්හදා බැලිය හැකිය.

**එක්සත් ජනපද ආකෘතිය - The UK Recall MP,s Act 2015** ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමය බ්‍රිතාන්‍යයේ වෙස්ට්මින්ස්ටර් ක්‍රමයට සමාන බැවින් බ්‍රිතාන්‍යය

2015 දී හඳුන්වාදුන් ක්‍රමවේදය අප රටට ද ගැලපෙන්නේදැයි අත්හදා බැලිය හැකිය.

## 22. මැතිවරණ / ඡන්ද විමසීම් කාල සීමාව තුළ රජයේ නිළධාරීන්, පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම

රජයේ අමාත්‍යංශ, කොමිෂන් සභා, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය අධිකාරී, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්ව විද්‍යාල ආදී රජයේ සියලුම ආයතනවල මැතිවරණය කාලයේදී සිදු කරන, උසස් කිරීම්, පත් කිරීම්, මාරු කිරීම් පිළිබඳ නිශ්චිත නියමයන් අදාළ පනත් වලට ඇතුළත් කිරීම.

## 23. වත්කම් බැරකම් ප්‍රකාශ

23.1 නාම යෝජනා බාරදෙන අවස්ථාවේදීම නිසි පරිදි සකස් කරන ලද වත්කම් බැරකම් ප්‍රකාශ මැතිවරණ කොමිෂන් සභාව වෙත බාරදිය යුත්තේය. මේ සඳහා දැනට පවතින වත්කම් බැරකම් පනතේ ප්‍රකාශන ආකෘතියට පරිබාහිරව නව ආකෘතියක් හඳුන්වා දීමට මැතිවරණ කොමිෂන් සභාවට හැකියාව ඇත.

23.2 එසේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදෙන්නේ නම් හෝ වැරදි තොරතුරු වත්කම් බැරකම් ප්‍රකාශයට ඇතුළත්ව ඇති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය / මන්ත්‍රී ධූරය අහිමි විය යුත්තේ ය.

23.3 වත්කම් බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ ලේඛනයක් බවට පත්විය යුතු අතර එම ලේඛන ප්‍රසිද්ධ කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ වගකීමක් විය යුත්තේය.

## 24. පොදු නීති සංශෝධන

24.1 මැතිවරණ ව්‍යාපාරය සඳහා ආචාරධර්ම පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.

24.2 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතෙහි 70 වගන්තියට අනුව ප්‍රසිද්ධ රැස්වීම් සීමා කිරීම යටතේ මැතිවරණයකට පැය 48කට පෙර සහ මැතිවරණය අවසන් වීමෙන් පසු සතියක කාලයක් අවසන් වීමෙන් පසු ප්‍රසිද්ධ රැස්වීම් තහනම් කර ඇත. නමුත් ප්‍රචාරක කටයුතු නොකළ යුතු බවට සඳහන් පැය 48 ක කාලයට අදාළව ප්‍රධාන අපේක්ෂකයන්ගේ අවසන් රැළි විකාශය කිරීම සිදුවන බැවින් එම පනතේ අභිලාශය ඉටු නොවන බවක් පෙනෙන්නට තිබේ. වත්මන් භාවිතය තුළ ප්‍රචාරක කටයුතු නොකළ යුතු බව සඳහන් පැය 48 ක කාලය තුළ ද ඊට පෙර පැවැත්වූ අවසන් රැළිවල තොරතුරු ප්‍රවෘත්ති මගින් විකාශනය කරනු ලබන බැවින් කිසිදු හේතුවක් මත අදාළ කාල සීමාව තුළ එවැනි විකාශනයන් සිදු නොකළ යුතු බවට ප්‍රතිපාදනයක් ඇතුළත් කිරීමට යෝජනා කරමු.

24.3 පළාත් පාලන ඡන්ද විමසීමේ ආඥා පනතේ 262 අධිකාරයේ 82 (ට) වගන්තියට අනුව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කළ හැක්කේ අපේක්ෂකයෙකුට පමණක් බවට වන වගන්තිය සංශෝධනය කර අපේක්ෂකයෙකුට හා උනන්දුවක් දක්වන සාධාරණ පාර්ශ්වකරුවකුට යන්න ඇතුළත් කිරීම.

24.4 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතෙහි 74 වගන්තියේ අතපත්‍රිකා දැන්වීම් කොල ආදිය යන්නට සමාජ මාධ්‍ය, කෙටි පණිවුඩ හෝ එවැනි වෙනත් ආකාරයේ ක්‍රම මගින් සිදුකරණ ප්‍රචාරණද ඇතුළත් කිරීම.